# ඇය මගේ බිරිඳයි - - 2

වොෂ් එකක් දාගත්තු ජගත් නිල්පාට සරමකුයි අලුපාටට හුරු වී ෂර්ට් එකකුයි ඇඳන් හරිම වැදගත් විදිහට සාලේට ආවා. මමත් යන්තමට ඇඟපත හෝදගෙන සාලේට එනකොට ජගත් සාලේ සෝෆා එක උඩට වෙලා සැපට ඉඳන් හිටියා. ජගත් අතේ තිබුණේ අපි දෙන්නගෙ වෙඩිං ඇල්බම් එක. ජගත් ඒ දිහා හරිම අවධානයෙන් බලන් හිටියා. ඒත් එක්කම දුලීත් සාලේට ආවා. “නංගි ඒ දවස් වල ටිකක් කෙට්ටුයි නේද” ජගත් සිහින් හිනාවක් දාන ගමන් ඇහුවා. “ඔව් අයියෙ දැන් ටිකක් මහත්වෙලා. බබා හම්බවුනාට පස්සෙ ටිකක් විතර මහත් වුනා” ජගත්ට ටිකක් ඉස්සරහින් හිටන් හිටපු දුලී කීවා. “අනේ දෙවියනේ මට අමතක වුනානේ, චූටි දුවෙක් ඉන්නවා නේද, අනේ කෝ මටත් ආසයි එයාව බලන්න” ජගත් එකපාරටම හරිම උනන්දුවෙන් කීවා. “දැන්නම් කෙල්ල නිදි. උදේට බලමු, කමක් නෑ නේද” දුලීත් සුහදශීලීව කීවා. “අනේ කමක් නෑ” ජගත් අමුතු අහිංසක හිනාවක් දැම්මා. “කෑම නම් ලෑස්තියි අයියා, කෑම ටිකක් කාලා ඉමුද” දුලී කීවා. ජගත් හැරිලා මගෙ දිහා බැලුවා. “රුක්ෂාන් කමුද එහෙනම්, මටත් ටිකක් බඩගිනියි” ජගත්ගේ මූණේ බඩගිනි බවක් ඇත්තටම ඇඳිලා තිබුණා. අපි දෙන්නා මේසේ ඉඳන් කෑමට වාඩිවුනා. දුලී අපිත් එක්ක කන්න වාඩි වුනේ නෑ. “කෝ නංගි ඔයා කන්නෙ නැද්ද” ජගත් කීවා. “නෑ අයියා, මම පස්සෙ කන්නම්. ඔයාලා කන්නකෝ” දුලී පුංචි හිනාවක් දාලා කීවා. “බෑ.. බෑ නංගි, එහෙම බෑ. අපි එකටම කමු. නැත්තම් මම කන්නෙත් නෑ..” ජගත් පෙරැත්ත කලා. “එන්න බබා ඔයත් කමු” මමත් දුලීට කීවා. කොහොමහරි දුලීත් අපිත් එක්ක ඉඳගෙන කන්න ගත්තා. “රුක්ෂාන් ඇයි අනේ මම මෙච්චර අවාසනාවන්ත” ජගත් එකපාරටම කීව දෙයින් මමයි දුලියි පුදුම වුනා. අපි දෙන්නා එකපාරටම එකිනෙකාගේ මූණ බලාගත්තා. “ඇයි මොකද අවුල” මම ඇහැව්වා. “ඇයි දෙවියනෙ මේ වගේ බිරිඳක් මට නොලැබුණේ. මේ තමයි මම කාපු රසම කෑම වේල. ඇත්තටම මාර රසක් නංගි... බැරිද රුක්ෂාන්ව ඩිවෝස්

WalkathaPDF.com

කරලා මාව මැරිකරන්න...” ජගත් ඒක කියලා හයියෙන් හිනාවෙන්න ගත්තා. දුලීටත් ඒකට හොඳටම හිනාගියා. මමත් බලෙන් වගේ ඒ දෙන්නට එකතු වෙලා හිනාවුනා. “අත්ගුණේ තමයි අයියා. ඒ වගේම කෑමක් හදද්දි ආදරෙන් හදන්න ඕනා” දුලී කට කොනින් අහිංසක හිනාවක් දාගෙන කීවා. “මට නම් මාර ඊරිසියයි ඔයා ගැන රුක්ෂාන්. මේ වගේ පර්ෆෙක්ට් වයිෆ් කෙනෙක් ලබන්න ඔයා නම් මාරම ලකී..” ජගත් හොඳට තලු මර මරා ගිලින ගමන් කීවා. දුලී ආයෙත් අහිංසක හිනාව දාගෙන මගෙ දිහා බලලා මට හෙමීට ඇහැක් ගැහුවා. අපි ආගිය තොරතුරු කථා කර කර තව ටික වෙලාවක් උන්නා. වැඩි වෙලාවක් යන්න කලින් දුලී ජගත් එක්ක මාර විදිහට ෆිට් වුනා. දැන් දෙන්නා හරියට හොඳ යාලුවෝ වගේ. කොහොමහරි කෑම කාලා ඉවර වෙලා වල්පල් දොඩෝලා එවර වෙනකොට වෙලාව රෑ දහයත් පහුවෙලා. පහුවදා වැඩට යන්නත් තියෙන නිසා අපි ජගත්ට සමුදීලා, ඇඳට ගියා. දුලී හිටියෙ අමුතුම පිබිදීමකින්. මට ඒක හොඳටම තේරුණා. දුවව තොටිල්ලෙන් තියපු දුලී මට තුරුල් වෙලා ගොඩාක් ලංවුනා. අපි දෙන්නා ගොඩාක් වෙලා කිස් කලා. මම එයාව ස්පර්ශ කලා. හැබැයි එදා අපි ලොකු දෙයක් කලේ නෑ. එහෙම්ම හෙමීට නින්දට ගියා. මම පහුවදා නැගිටින කොටත් දුලී තේ හදන්න කුස්සියට ගිහින්. මමත් හෙමීට කුස්සිය දිහාට ගියා. ඒ වෙනකොටත් අවදිවෙලා හිටිය ජගත් කුස්සියෙ මේසේට වෙලා ඉඳන් ඉන්නවා. එයිට ටිකක් ඉස්සරහින් දුලී තේ හදනවා. දුලී දිහා කන්න වගේ බලන් හිටිය ජගත් මාව දැකලා “ගුඩ් මෝනිං” කීවා. මමත් ඒකම නැවත කිව්වා. දුලී හිටියේ කලින් රෑ ඇඳන් හිටිය රෝස පාට නයිට් ගවුම ඇඳගෙන ඒකට උඩින් ඕවර් කෝට් දාලා සේරම හොඳට වහගෙන. දුලී කවදත් එහෙමයි කිසිම දවසක මගෙ ඉස්සරහවත් ඇඟ පේන්න ඇන්දෙ නෑ. ඒ නිසා ජගත් ඉස්සරහා එයා කොහොමත් ඇඟ නොපෙනෙන්න අඳින බව මම හොඳටම දන්නවා. එකපාරටම දුව ඇහැරිලා අඬන්න පටන්ගත්තා. දුලී දුවලා ගිහින් දුවව වඩාගෙන ආවා. “අනේ.. අනේ ඇයි අඬන්නෙ චූටි නෝනා” ජගත් ආදරෙන් දුවව වඩාගෙන හුරතල් කරන්න ගත්තා.

WalkathaPDF.com

දුවත් කිසිම ගානක් නැතුව ජගත්ගෙ තුරලේ ඉන්නවා. “අම්මි වගේම ලස්සන චූටි මැණිකක් මේක” ජගත් දුවව හුරතල් කරන ගමන් කීවා. එදා උදේ අපි තුන් දෙනා අතර වැඩි කථා බහක් ඇති වුනේ නෑ . මමත් වැඩට යන්න ලෑස්ති වුනා. ජගතුත් වැඩ වගයක් තියෙනවා කියලා යන්න පිටත් වුනා. වෙනදා වගේම දුලීයි දුවයි තමයි ගෙදර තනියම. එදා වැඩට ගිහින් මේ හැමදෙයක් ගැනම මම ටිකක් කල්පනා කලා. මම මේ කරන දේ හරිද. මොකක්ද මම මේ කරන්න හදන්නෙ. මගෙ හිත මටම කීවා ජගත් මහලොකුවට කීවට ජගත්ට මේ වගේ දෙයක් කරන්න පුලුවන්ද. කට තියෙන තරම් වැඩකාරයෙක්ද මෙයා, මගෙ හිත මට කීවා. ඔහොම ඉද්දි දවල් එකට විතර මට එක පාරටම ජගත්ගෙන් කෝල් එකක් ආවා. “රුක්ෂාන් ඔයාගේ වයිෆ් ෆිල්ම් එහෙම බලනවා නේද” ජගත් එකපාරටම මගෙන් ඇහුවා. මට එකපාරටම මොනවා කියන්නද හිතුනේ නෑ. “ඔව්” මම උත්තරදුන්නා. “අර වගේ ඒවත් බලනවා ඇති නේද” පොර ආයෙත් ඇහුවා. “ඔව් ඉතින්, මම කියලා තියෙන්නෙ ඔයාට” මම උත්තර දුන්නා. “හ්ම් හරි හරි රුක්ෂාන් හවසට මීට් වෙමු” කීව ජගත් ෆෝන් එක තිබ්බා. මගෙ හිතට හරිම කුතුහලයක් දැනෙන්න ගත්තා. මූ උස්සන් ඇවිත් දුලීට වැලක්වත් පෙන්නයිද. මේකා මටත් එක්ක ගෙදරින් යන්න වැඩක් සෙට් කරයිද. මට මේ මිනිහව ගෙදරට වද්ද නොගන්න තිබුණේ. මගෙ හිතට හරිම බයක් දැනෙන්න ගත්තා. මම ආයෙත් ජගත්ගෙ ෆෝන් එකට ගන්න උත්සාහා කලා. ඒත් ෆෝන් එක ඕෆ්. එදත් මම ටිකක් කලින්ම ගෙදර ගියා. ගෙදර ගිහින් විනාඩි පහක් ගියෙ නෑ ජගත්ගෙන් කෝල් එකක් ආවා. “ආ..රු ක්ෂාන් මම එනගමන් ඔයා ගෙදර ආවද” ජගත් ඇහැව්වා. මමත් “ඔව්” කියලා උත්තර දුන්නා. “මොකද ඔයාගේ ෆෝන් එක ඕෆ්” මම ඇහැව්වා. “අනේ ඔව් රුක්ෂාන්, මම පොඩි වැඩක හිටියේ ඒකයි.. සොරි, මම දැන් ලඟ ඉන්නෙ ඇවිත් කථා කරමු” කියපු ජගත් ෆෝන් එක තිබ්බා. සුදු පාට කොට සායකුයි නිල් පාට බ්ලවුස් එකකුයි ඇඳන් හිටපු දුලී මම යනකොට දුවව නලව නලව හිටියා. කොට ස්කර්ට් ඇඳපුවාම දුලීගේ මාරම ලස්සනක් තිබුණේ. එයා ටිකක් මහත නිසත් ඒකෙන් දුලීට අමුතුම සෙක්සි ගතියක් ආවා. තව විනාඩි පහක් ගියේ නෑ

WalkathaPDF.com

ඡගතුත් ආවා. දුවව නිදිකරවපු දුලී ඡගත්ටයි මටයි තේ දෙකක් හදලා දුන්නා. “රුක්ෂාන් නියම ෆිල්ම් එකක් තියෙනවා බලමුද අපි” තේ එක බොන ගමන් ඡගත් ඇහැව්වා. “මොකක්ද ස්ටෝරිය” මම නිකං සැකේට වගේ ඇහැව්වා. “ස්ටෝරිය ෆැමලි එකක්. මොකද කියන්නෙ නංගි බලමුද” ඡගත් දුලී දිහා බලලා ඇහැව්වා. “හ්ම්.. බලමු බලමු. මාත් කම්මැලි කමේ හිටියෙ...” දුලී ගත්කටටම උත්තර දුන්නා. “එහෙනම් මම වොෂ් එකක් දාගෙන එන්නම්” ඡගත් තේ එක බීලා වොෂ් රූම් එකට ගියා. මමත් වැඩියේ මොකුත් නොකියා පිටිපස්සෙ බාත්රූම් එකට ගිහින් වොෂ් එකක් දාගත්තා. ඔන්න කොහොම හරි අපි තුන්දෙනාම ෆිල්ම් එක බලන්න සෙට් වුනා. මූණෙන් නොපෙන්නුවට මම මාරම විදිහට බයවෙලා හිටියේ මූ මොන මගුලක් දායිද කියලා. ඔන්න දැන් ෆිල්ම් එක පටන්ගත්තා. ඒක නෝමල් ස්ටෝරියක් වගේ. කථාව හෙමීට ගලාගෙන යනවා. මගෙ බය ටිකෙන් ටික සැහැල්ලු වෙන්න ගත්තා. මම හොඳට සැහැල්ලු වෙලා පුටුවට බරවෙලා නිදහසේ කථාව රසවිඳන්න හිතුවා. එකපාරටම කථාවේ නලුවයි නිලියයි බරටම කිස් කරන සීන් එකක් පටන්ගත්තා. දුලී ලැජ්ජා හිතිලා වගේ නැගිටලා යන්න හැදුවා. “අයියෝ මොකද මේ, ඔයාලා මැරි කරපු කපල් එකක් නේද, මේ වගේ පුංචි දෙයක් අප්සට්ද” ඡගත් හිනාවෙන ගමන් කීවා. “නෑ.. මම මේ දුවව බලලා එන්නම්” දුලී බිම බලාගෙන වගේ කීවා. “අයියෝ ළමයෝ කොහෙ යන්නද ඔයාට කථාව මිස්වෙයි. හරි හරි මම ඒවා ටික පාස් ඇරලා දාන්නම්” ඡගත් ඒ සීන් ටික පාස් කරලා දැම්මා. දුලී ආයෙත් ඉඳගෙන ෆිල්ම් එක බලන්න ගත්තා. ඒක හරිම නෝමල් ෆිල්ම් එකක්. ඡගත් මේ ෆිල්ම් එක පෙන්නලා බලාපොරොත්තු උනේ මොකක්ද කියලා මම ගොඩාක් කල්පනා කලා. කොච්චර කල්පනා කලත් මට ඒක ඇත්තටම තේරුම් ගන්න බැරිව ගියා. එදා රෑත් අපි කෑම මේසේට වාඩිවුනා. “හෙට එකොලහට දුවගේ බර කිරන්න එක්කන් යන්න ඕනා ඔයාට මතකයි නේද” දුලී ඇහුවා. “ආ... සුදූ මට දැන්නෙ ඒක මතක් වුනේ. හෙට උදේ ලොකු ක්ලයන්ට් කෙනෙක් එනවා. ඒක මිස් කරගන්න බෑ. ඒක වෙන කෙනෙක්ට බාර දෙන්නත් බෑ... මොකද කරන්නෙ” මම කීවා. “අනේ ඒයි එහෙම කියලා බෑනේ. හෙට යන්නම ඕනා”

WalKathaPDF.com

දුලී ටිකක් තරහින් වගේ කීවා. “කොහෙද තියෙන්නෙ බර කිරන තැන” ජගත් අපි දෙන්නා මැද්දට පැනගෙන ඇහුවා. “වැඩි ඈතක් නෑ අයියා. හන්දි තුනක් විතර ඉස්සරහා” දුලී කීවා. “එහෙනම් කමක් නෑ, මම එක්කන් යන්නම්, මට හෙට ලොකු වැඩකුත් නෑ” ජගත් සන්සුන්ව කීවා. දුලී හොරැහින් මගෙ දිහා බැලුවා. “එපා අයියා ඔයාටත් කරදරයක්නෙ” දුලී ටිකක් අකමැත්තෙන් වගේ කීවා. “අයියෝ කිසිම කරදරයක් නෑ නංගි, මම ඔයාලව එක්කන් ගිහින් ගෙනත් දාලම යන්නම්. කිසිම අවුලක් නෑ” ජගත් ආයෙත් කීවා. ආයෙත් ටිකක් අකමැත්තෙන් වගේ මගෙ දිහා බලපු දුලී “හ්ම්ම්” කියලා විතරක් උත්තර දුන්නා. එදා ඇඳට ගිය ගමන්ම දුලී “ඔයාට එන්නම බැරිද” ටිකක් තදින් ඇහුවා. “අනේ.. තේරුම් ගන්න සුදූ , හෙට මට උපරිම ඉම්පෝර්ටන්ට් දවසක්” මම කීවා. “මට බෑ අනේ අරයා එක්ක යන්න, හරි නෑ වගේනේ ඒක” දුලී ආයෙත් කීවා. “ආයේ ඉතින් ඕක මහලොකු දෙයක්ද, දුවගෙ වැඩකටනෙ යන්නෙ. ඔයා ගිහින් පාඩුවේ එන්න..” මම වැඩිය ගණන් නොගෙන වගේ කීවා. ඒ උනාට මගෙ හිත ඇතුලෙ තිබුණේ චකිතයක්. ජගත් එක්ක දුලීව යවන එක නුවණට හුරුද, මගෙ හිත වෙනදා වගේම මට කීවා. “හරි හරි උදේට බලමුකො” දුලී ආයෙත් නොරිස්සන ගතියෙන් කීවා.

පහුවෙනිදත් අපි වෙනදා වගේම කාලා බීලා ලෑස්ති වුනා. දුවව ලෑස්ති කරගත්තු දුලී නිල්පාට ඩෙනිමකුයි සුදු පාට ටී ෂර්ට් එකකුයි ඇඳගෙන ජගත් එක්ක යන්න පිටත් වුනා. ඒ උනාට දුලී ඒ ගමන යන්න පිටත් වුනේ අකමැත්තෙන් බව මට දුලීගේ මුණෙන්ම තේරුණා. කාර් එකේ නැගුනු ජගතුත් දුලීත් පිටත් වෙලා ගියා. මමත් ඒත් එක්කම ෂොප් එකට යන්න පිටත් වුනා. එදා උදේ වරුවෙම මගෙ හිතේ තිබුණේ හරිම චකිතයක්. මම දෙතුන් පාරක්ම දුලීට කෝල් කරන්න හිතුවත් වැඩ අධික නිසාම මට ඒක කරන්න බැරි වුනා. කොහොම හරි දවල් දෙකට විතර මම දුලීට කෝල් එකක් ගත්තා. “හලෝ සුදූ ඔයා ආවද” මම ඇහැව්වා. “ඔව් බබා මම දැන් පැය බාගෙකට වගේ කලින් ආවේ. සොරි කෝල් එකක්වත් දෙන්න බැරි වුනා. ආපු ගමන්ම කෙල්ලව නිදි කෙරෙව්වා

WalkathaPDF.com

ඒකයි" දුලී උත්තරදුන්නා. "මේ... කෝ ජගත්" මම ගණන් නොගෙන වගේ ඇහැව්වා. "එයා මාව ඩොර්ජ් කරලා ගියා" දුලී ටිකක් අමුතු විදිහකට උත්තර දුන්නා. දුලී කථාබහ කරන හැටි මම හොඳටම දන්නවා. ඒත් එයා ඒක කියපු හැටියේ මට මොකක් හරි වෙනසක් තේරුණා. "මොකුත් අවුලක් නෑනේ, හැමදේම හොඳින් නේද" මම ආයෙත් ඇහුවා. "කිසිම අවුලක් නෑ සුදූ, හැමදේම හොඳින්, ඔයා පුලුවන්නම් කලින් ගෙදර එන්න" දුලී ආයෙත් ටිකක් අමුතු ස්වරයකින් කීවා. ෆෝන් එක තිබ්බට පස්සෙ මම ඒ ගැන ටිකක් කල්පනා කලා. සමහරවිට මට හිතෙන හැටි වෙන්න ඇති. මම ඉක්මනින්ම ඒ ගැන අමතක කරලා දැම්මා. එදා දවසටවත් මට ජගත්ගෙන් කෝල් එකක් ආවේ නෑ. ඒවගේම මම ඒ තරම්ම ඒ ගැන හිතුවෙත් නෑ. එදත් හවස මම ටිකක් කලින්ම ගෙදර ගියා. ඒ වෙනකොටත් ජගත් ඇවිල්ලා හිටියෙ නෑ. දුලිත් සාලේට වෙලා දුවට කිරි දිදී නලව නලව හිටියා. "බර කිරන නැන මොකද කීවේ" මම දුලී ලඟ වාඩි වෙමින් ඇහැව්වා. "හැමදෙයක්ම නෝමල්. අපේ කෙල්ල හොඳින් ඉන්නවා" දුලී හිනාවෙලා කීවා. මම දුලීගේ නලලට කිස් එකක් දීලා දුලීව ටිකක් ආදරෙන් තුරුල් කරගත්තා. දුලිත් මගෙ ඉනවටේ අත යවලා මාව මිරිකලා බදාගත්තා. ඊයේ වගේම විනාඩි දහයක් ගියෙ නෑ ජගත් ආවා. අද ඊයේ වගේ නෙවේ ජගත් මට ගෙදර ආවද අහන්න කෝල් කලේවත් නෑ. නමුත් මම ඒක වැඩිය ගනන් ගත්තෙ නෑ. ගෙට ගොඩ වුනු ගමන්ම ජගත් බැලුවේ දුලී දිහා. දුලිත් පෙරලා ජගත් දිහා බලන හැටි මම දැක්කා. දුලී කවදාවත් කවුරු දිහාමවත් ඒ වගේ අමුතු බැල්මක් හෙලනවා මම කවදාවත්ම දැකලා තිබුණේ නෑ. මට ඒ ගැන පොඩි සැකයක් ඇති වෙන්න ගත්තා. "රැක්ෂාන් ඉතින් කොහොමද අද දවස.... බිසී වුනාද" ජගත් මගෙ ලඟින් වාඩිවෙන ගමන් ඇහුවා. "ඔව් මම අර ඊයේ කීව ක්ලයන්ට් ආවා. ඒ නිසා පොඩ්ඩක් බිසී වුනා" මම හිනාවක් දාගෙන කීවා. "අනේ නංගියො තරහා නැතුව තේ එකක් බොමුද.." ජගත් දුලීට හෙමීට කීවා. දුලිත් ජගත් දිහා බලලා හීනී හිනාවක් දාලා දුවව මගෙ අතට දීලා නැගිට්ටා. "මටත් එකක්" මමත් කීවා. "කොහොමත් ඔයාට හදනවනේ" දුලී වෙනදා නැති හරිම මිහිරි බවකින් කීවා. මට ඒ වෙලාවෙත් දුලීගේ මොකාක් හරි

WalkathaPDF.com

වෙනසක් තේරුණා. දුලී කුස්සියට යනකන් හිටපු මම හෙමීට ජගත් එක්ක කථා කලා. “මොනවා හරි දෙයක් වුනාද” මම කුතුහලයෙන් ඇහුවා. “එහෙම වුනා කියලා හිතෙනවද” ජගත් මගෙන් අමුතු විදිහට ආපහු ඇහැව්වා. “අනේ මංදා, මට අමුතු හැඟීමක් වෙනසක් දැනෙනවා” මම ආයෙත් රහසින් වගේ කීවා.” “කවුරු ගැනද” ජගත් ආයෙත් හෙමීට ඇහැව්වා. “දුලී ගැන තමයි වෙන කවුරු ගැනද” මම ටිකක් තදින් වගේ කීවා. “රුක්ෂාන් මහත්තයො, ගෑනියෙක් හරියට වහලා තියෙන සේප්පුවක් වගේ. ඒ සේප්පුව ඇතුලෙ ගොඩාක් දේවල් හැංගිලා තියෙනවා. ඒ වගේම සේප්පුව හැමෝටම අරින්නත් බෑ. ඒ සේප්පුව ඇතුලෙ තියෙන දේවල් එලියට ගන්නත් බෑ. හැබැයි ඒ සේප්පුව කඩලා ඒකේ ඇතුලෙ තියෙන දේවල් ගන්න පුලුවන් දක්ශයො ඉතාම සුලු පිරිසක් ඉන්නවා. හිතාගන්න ඒ සේප්පුව ඇරුණා කියලා රුක්ෂාන් මහත්තයො. ඔයාට ඔයාගේ වයිෆ්ගෙ වෙනස්ම ස්වරූපයක් මම පෙන්නනම්.... හැබැයි මට වෙච්ච පොරොන්දුව මතකයිනෙ. එතනින් පස්සෙ මට ඕන විදිහට තමයි හැමදේම වෙන්නෙ... මතකයිනෙ නේද” ජගත් ඒක කියන් ගිය විදිහට මගෙ මුලු ඇඟම හිරි වැටිලා ගියා. මට එකපාරටම මහා අමුතු බයකුත් දැනෙන්න ගත්තා. “අගේ කරන්නෙ නැතුව කියනවකො ජගත් මොකද වුනේ කියලා. මට දැනගන්න ඕනා” මම උපරිම කුතුහලයෙන් කීවා. “මම ඔයාට පොරොන්දු වුනේ ඒ දේ කරලා පෙන්නනවා කියලා. කරන විදිහ කියන්න මම පොරොන්දු වුනේ නෑනේ. ඔහොම ඉවසන් ඉන්නකො හෙමීට හොඳ හොඳ සෙල්ලම් ටිකක් පෙන්නන්නම්” ජගත් ආයෙත් හරිම අමුතු විදිහකට කීවා. ඒත් එක්කම දුලී තේත් හදාගෙන අපි දිහාවට ආවා. තේ එක දෙන ගමන් දුලීයි ජගතුයි අතර අමුතුම බැල්මක් හුවමාරු වෙන හැටි මම දැක්කා. මොකක්ද දුලීගේ මේ වෙනස. මොකක්ද මේ වෙන්න යන්නෙ, ජගත් මට නොකියන දේ මොකක්ද. මගෙ හිත ආයෙත් මට තදින්ම වද දෙන්න පටන්ගත්තා ...........

මතු සම්බන්ධයි............

WalkathaPDF.com

කථාවට කමෙන්ට් කරන්න අමතක කරන්න එපා. හොඳ කමෙන්ට් ගොඩක් බලාපොරොත්තු වෙනවා.......

රචනය —— **C.D**

WalKathaPDF.com

# Thank You for Reading!

## කතාව කියෙව්වාට ස්තූතියි!

## This Wal Katha PDF was downloaded from [walkathapdf.com](https://walkathapdf.com)

**පහල Link එකෙන් තවත් Wal Katha කියවන්න**
**https://walkathapdf.com**

ඔයාගෙ කතාවත් අපේ site එකේ පලකරගන්න කැමති නම් අපේ email එකට දැන්ම එවන්න
**walkathapdf@gmail.com**

*All content is intended for adults 18+. Sharing or reproducing without permission is prohibited.*